දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்

## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල

இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை

**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය / எனது இல. / My No.: PSC/DIS/01/07/202

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.08. 2

---

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි: 03/2024

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**තනතුර අතහැරයාමේ නිවේදනවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම**

රාජ්‍ය නිලධාරින් නොදන්වා සේවයට වාර්තා නොකිරීම මත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 213 සහ 214 වගන්ති යටතේ කටයුතු කිරීමේදී ඇතැම් අවස්ථාවලදී ප්‍රමාණවත් හා සාධාරණ කාලසීමාවක් ලබා නොදීම මත නිලධරයන්ට අසාධාරණයක් වන බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. එසේම, ඇතැම් අවස්ථාවල සේවය හැරයාමේ නිවේදන නිකුත් කිරීමට වසරකට වැඩි කාලයක් ගතවන බවද නිරීක්ෂණය වී ඇත.

02. එබැවින් මෙම තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු/ පත්වීම් බලධාරියෙකු/ විනය බලධාරියෙකු විසින් අදාළ නිලධාරියා සේවයට වාර්තා නොකළ දින සිට වැඩ කරන දින පහකට (05) පසුව එළඹෙන පළමු වැඩ කරන දින පහක් (05) ඇතුළත සේවය හැරයාමේ නිවේදනයන් නිකුත් කළ යුතුය. එසේ යම් නිලධරයෙකු වෙත සේවය හැරයාමේ නිවේදනයක් ලද අවස්ථාවක ඔහු/ඇය විසින් එකී සේවය හැරයාමේ නිවේදනය සම්බන්ධයෙන් නිදහසට කරුණු දැක්වීමක් සිදුකරනු ලබන්නේ නම්, එය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හි 216 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුය.

03. එසේම, යම් නිලධරයෙකු විසින් තනතුර අතහැරයාමේ නිවේදනයකට අදාළව ස්ව කැමැත්තෙන් ඉදිරිපත් කරනු ලබන නිදහසට කරුණු දැක්වීම් සම්බන්ධයෙන්, අදාළ විනය බලධරයා විසින් දෙනු ලබන තීරණය නිලධාරියා වෙත ලිඛිතව දැන්විය යුතුය. විනය බලධරයාගේ එකී තීරණය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන්නේ නම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 222හි දක්වා ඇති නිශ්චිත කාලසීමාව තුළ අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බව අදාළ තීරණය දැන්වීමේ ලිපියට ඇතුළත් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

Ndayan

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව